# ශ්‍රී ලංකාවේ අපනයන බෝග කර්මාන්තය හමුවේ ඇති ගැටළු සහ අභියෝග


අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥ

**අනුර හේරත් විසිනි.**


## වර්තමාන තත්වය

ඈත අතීතයේ පටන් ශ්‍රී ලංකාව කුළු බඩු වලට ප්‍රසිද්ධියක් ඉසිලීය. එකල යුරෝපීයයන් ශ්‍රී ලංකාව පිළිබඳව දැන ගන්නා ලද්දේ කුළු බඩු ඒකාධිකාරියක් පවත්වා ගෙන යමින් සිටි අරාබි වෙළෙඳුන් මගින් ය. වර්තමානයේ කුරුඳු, ගම්මිරිස්, කරාබු, කරදමුංගු, සාදික්කා හා බුලත් යන බෝග කෙරෙහි වැඩි අවධානයක් යොමු වී ඇත. ඒවා මගින් දළ දේශීය නිෂ්පාදනයේ 0.5% ක් ආවරණය වන අතර, විදේශ විනිමය ආදායමෙන් 1.3% ක් ආවරණය වේ. 1997 වසරේ දී කුළු බඩු වෙළෙඳාමෙන් ලද ආදායම රු. 3920000000/= ක් පමණ වේ. රටවල් 70 කට පමණ ශ්‍රී ලංකාවේ කුළු බඩු ආනයනය කරන අතර, ඒවා අතරින් 20 ක් ලොව ප්‍රධාන කුළු බඩු ආනයනය කරන රටවල් වේ. එම නිසා අපට ඉතා ස්ථාවර වූ විදේශීය කුළු බඩු වෙළෙඳ පොළක් ඇත. 200000 ක් පමණ වූ වගා කරුවන් විසින් තෙත් කලාපයේ හෙක්ටයාර් 50,000 ක් පමණ බිම් ප්‍රමාණයක් තුළ කුළු බඩු වගා කරනු ලබයි. වගා කරුවන්ට අමතරව තවත් 10000 ක් පමණ වූ ග්‍රාමීය පිරිසකට එමගින් රැකියා සැපයේ. කුළු බඩු වගා කිරීම හා සකස් කිරීම සඳහා විශාල ශ්‍රමයක් වැය වන අතර, මේ සඳහා කාන්තා ශ්‍රමය බහුලව උපයෝගී කර ගැනේ.

දේශීය කුළු බඩු අංශය පසුගිය දශකය තුළ ක්‍රමානුකූලව වර්ධනය වී ඇත. 1980 වසරේ දී හෙක්ටයාර් 30240 ක් වූ කුළු බඩු වපසරිය 1997 වන විට හෙක්ටයාර් 53640 ක් දක්වා වැඩි වී ඇති අතර, කුළු බඩු අපනයනය ටොන් 10300 යේ සිට 16480 දක්වාත්, වැඩි වී ඇත. ලෝක තත්වයේ ද කුළු බඩු වල විශාල වර්ධනයක් දක්නට ලැබේ. 1970 - 1975 කාලය තුළ ජගත් කුළු බඩු ආනයනය ටොන් 220000 ක් වූ අතර, 1993 - 1995 තෙ වසර තුළ එය ටොන් 500000 දක්වා ඉහළ ගොස් ඇත. ඇමෙරිකා එක්සත් ජනපදයේ එක පුද්ගල කුළු බඩු පරිභෝජනය 1980 - 1985 කාලය තුළ ග්‍රෑම් 1057 සිට 1990 - 94 කාලය තුළ ග්‍රෑම් 1447 දක්වා ඉහළ ගොස් ඇත. පරිමාවක් වශයෙන් ගත් කල ඒ රට කුළු බඩු පරිභෝජනය වසරකට 3 - 4% කින් වැඩි වන බව ගණන් බලා ඇත.

## නිෂ්පාදනය හා වත්මාන තත්වය

දේශීය කුළු බඩු නිෂ්පාදන වැය ඉතා ඉහළ මට්ටමක පවතී. මේ සඳහා ඒ ඒ බෝගයේ පූර්ණ අස්වනු විභවය ට වඩා අඩු අස්වනු ලබා ගැනීම, අඩු අස්වනු සහිත ප්‍රභේද වගා කොට තිබීම, පැළ ඝනය අඩු වීම, වයස් ගත වූ ශාක ක්ෂේත්‍ර යේ තිබීම, කම්කරු වියදම් අධික වීම හා කම්කරු හිඟය යන කරුණු බලපාන බව පෙනී යයි.

නිෂ්පාදනය හා සම්බන්ධ අනෙක් කරුණ ගුණාත්මය වේ. විදේශීය වෙළෙඳ පොළ වලට අවැසි තත්වයන්ට වඩා ඉතා පහත් ගුණාත්මයකින් යුතු කුළු බඩු, ගොවිපල් වලින් ඉදිරිපත් කෙරේ. බොහෝ නිෂ්පාදකයින් වෙත යෝග්‍ය මට්ටමේ සකස් කිරීමේ පහසුකම් නොමැත. නිෂ්පාදන සකස් කල යුතු පරාමිතික පිළිබඳ අවබෝධයක් ද ඔවුන්ට නො මැත. සුළු පරිමාන නිෂ්පාදකයින් විසින් ඔවුන් ගේ දෛනික ජීවන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සුළු ප්‍රමාණ වෙළෙඳ පොළ වෙත ඉදිරිපත් කරනු ලැබේ. මෙ වැනි සුළු ප්‍රමාණ අවශ්‍ය වන තත්ව මට්ටමට සකස් කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවේ. හදිසියේ ඇතිවන අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහා නිෂ්පාදකයෝ නිසි පරිදි මේරීමට පෙර ඵලදාව නෙළා ගනිති. ප්‍රශස්ත මට්ටමට නො මේරූ අස්වැන්නක් මගින් උසස් ප්‍රමිතියක නිෂ්පාදන ලබා ගැනීම අපහසු වේ. අනික් අතට උසස් තත්වයේ නිෂ්පාදන ඉදිරිපත් කළ ද, ඒවාට ග්‍රාමීය මට්ටමේ දී පහත් තත්වයේ නිෂ්පාදන වලට වඩා හොඳ මිලක් ලබා ගැනීම අපහසු වේ. සුළු පරිමාන නිෂ්පාදකයින් අනුගමනය කරන සැකසුම් තාක්ෂණය ප්‍රමාණවත් නොවේ.

කුළු බඩු කර්මාන්ත සංවර්ධනයේ දී වටිනාකම වැඩි කිරීමේ ක්‍රියාවලිය ඉතා වැදගත් අංගයක් වේ. එහෙත් මේ සඳහාද බාධක රැසක් පවතී. රට තුළින් නිතිපතා අවශ්‍ය ප්‍රමාණයට කුළු බඩු සපයා ගත නො හැකි වීම ඒවා අතරින් ප්‍රධාන වේ. මේ නිසා කුළු බඩු සකස් කිරීමේ කර්මාන්තයට මුදල් ආයෝජනය කරන්නන්ට ආයෝජනයේ තරමට වාසිදායක තත්වයක් උදා නොවේ. කුළු බඩු වල වටිනාකම වැඩි කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය ශ්‍රී ලංකාවේ ඉතා අල්ප වේ. එහෙත් මේ සම්බන්ධව යාබද ඉන්දියාව අපට වඩා පියවර කිහිපයක් ඉදිරියෙන් සිටී. වටිනාකම වැඩි කිරීම සඳහා යාන්ත්‍රිකරණය අවශ්‍ය වේ. ඒ අනුව යන්ත්‍ර පිරිවැය සහ ඒවා ක්‍රියා කරවීම සඳහා වැය වන බල ශක්ති පිරිවැය ද බාධකයක් වීමට ඉඩ ඇත.

## දේශීය වෙළඳාම

බොහෝ වගා කරුවන් හා අතරමැදියන් ද සමහර කුළු බඩු අපනයන කරුවන් ද කුළු බඩු පරිභෝජනය කරන්නන් ගේ තත්ව අවශ්‍යතා පිළිබඳව වැටහීමකින් තොරව කටයුතු කරන බව පෙනේ. වාණිජ නාලිකා ඔස්සේ මෙම තොරතුරු වගා කරුවන් වෙත ළඟා වීම අපේක්ෂා කොට ඇති මුත් අපනයන කරුවන් විදේශීය පාරිභෝගිකයින් ගේ තත්ව අවශ්‍යතා පිළිබඳව වටහා ගෙන අතරමැදියන් හා වගා කරුවන් වෙත ඒ තොරතුරු සැපයීම කෙරෙහි උනන්දු වන බවක් නො පෙනේ. විදේශීය ආනයන කරුවන් ද දේශීය සැපයුම් කරුවන් වෙත තත්ව අවශ්‍යතා පිළිබඳව නිසි ලෙස දැනුම් දී නැති බව පැහැදිලිය. මේ නිසා ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද කුළු බඩු හා මිල ගණන් සංශෝධනය

කිරීම් ආදිය ප්‍රතික්ෂේප වූ අවස්ථා විරල නොවේ. කුළු බඩු වෙළෙඳාම මුළුමනින්ම පාහේ පෞද්ගලික අංශය මගින් ඉටුවේ. ඒ සඳහා කුළු බඩු හා ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලයෙන් ලැබෙන දායකත්වය ගණන් ගත නොහැකි තරම්ය. විදෙස් අවශ්‍යතා වලින් ඵල ලබා ගැනීම සඳහා ඒකාබද්ධ අලෙවි ක්‍රමෝපායක් හෝ වෙළෙඳාම මත පදනම් වූ නිෂ්පාදන සැලැස්මක් නොමැත. කුළු බඩු ක්ෂේත්‍රයේ මිල ගණන් සැකසී ඇති ආකාරය අගයෙන් වැඩි නිපැයුම් සකස් කිරීම සඳහා කෙරෙන ආයෝජනයට බාධාවක් වී ඇත. නිෂ්පාදක මිල ගණන් හා සුළු වෙළෙඳ මිල ගණන් සාමාන්‍ය ජගත් මිල ගණන් වලට ආසන්නයේ පවතී. මෙය වගා කරුවන්ට වාසිදායක වුවත්, අගය වැඩි කිරීමේ කර්මාන්ත සඳහා වූ ආයෝජනය උදාසීන කරවන සුළුය.

## අන්තර් ජාතික වෙළෙඳාම සහ ගැට් (GATT) වෙළෙඳාම හා තීරු බදු පිළිබඳ පොදු එකඟතාවය

විදෙස් රටවල ආණ්ඩු සහ ඒවායේ කර්මාන්ත කරුවන්ගේ සංගම් මගින් කර්මාන්ත සඳහා අමු ද්‍රව්‍ය සපයා ගැනීමේ දී ඉතා ඉහළ ප්‍රමිති අනුගමනය කිරීමට සලස්වා ඇත. මේ අනුව අපනයනය සඳහා කුළු බඩු බෝග වගා කිරීමේ දී ද පහත සඳහන් කරුණු අනුගමනය කිරීමට සිදුවේ.

(අ) කුළු බඩු බෝග වලට පලිබෝධ නාසක හා රසායනික පොහොර යෙදීමේ දී ඒවායේ අවසාන නිෂ්පාදන තුළ අහිතකර ද්‍රව්‍ය ශේෂ නො වන පරිදි පලිබෝධ නාශක තෝරා ගෙන නියමිත ආකාරයට පමණක් භාවිතා කළ යුතුය.

(ආ) නිසි කලට අස්වනු නෙළීම, සකස් කිරීම හා ගබඩා කිරීම සිදු කළ යුතුය.

(ඇ) අපනයන කරන කුළු බඩු වල අපද්‍රව්‍ය නො තිබිය යුතුය. සැකසුම් ඒකක හා ඒවායේ සේවකයින් ගේ සනීපාරක්ෂක මට්ටම ඉතා උසස් විය යුතුය.

ගැට් සම්මුතියෙන් බලපාන කරුණු අනුව දේශීය කුළු බඩු නිෂ්පාදනය ආරක්‍ෂා කළ හැක්කේ තීරු බදු පැනවීමෙන් පමණි. එහෙත් තීරු බදු අඩු කිරීමට සිදුවන අතර, නැවත ඉහළ නොයන ලෙස පවත්වා ගත යුතු වේ. වෙළෙඳාම කළ යුත්තේ රට ඉතා හිතකර වූ ජාතික ප්‍රතිපත්ති සැලකිල්ලට ගනිමිනි.

මේ අනුව දේශීය කුළු බඩු වෙළෙඳාමට වාසි දායක මෙන්ම අවාසි දායක අවස්ථා උද්ගත වේ. වාසි දායක තත්වයන් ගෙන් උපරිම ලෙස ඵල ලබා ගැනීමටත්, අවාසිදායක තත්වයන් ගෙන් වන හානිය අවම කිරීමට කටයුතු කිරීමත් අප හමුවේ ඇති අභියෝගය වේ.

කෘෂිකර්මයට බලපාන ගැට් සම්මුතියේ එකඟතාවයන් මත වෙළෙඳ පොළ සඳහා නිපදවන සාධාරණ හා යුක්ති සහගත කෘෂි වාණිජ ක්‍රමයක් අනුගමනය කළයුතු වේ. මෙය ක්‍රියාත්මක කිරීමේ දී භාණ්ඩ ආනයනය සඳහා සීමා පැනවීම හා භාණ්ඩ මිල පවත්වා ගැනීම සඳහා අපනයන සහනාධාර සැපයීම හා වෙනත් සහනාධාර සැපයීම අඩු කිරීමට සිදුවේ.

ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් බැවින් ඉහත එකඟතාවයන් යටතේ ශ්‍රී ලංකාවේ මුළු දේශීය කෘෂි නිෂ්පාදනයේ වටිනාකමින් 10% ක් දක්වා නිෂ්පාදකයින්ට සහනාධාර සැලසීම සඳහා අවකාශ ඇත. මේ අනුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහනාධාර ක්‍රමය ඉදිරියටත් පවත්වා ගැනීමට ඉඩ කඩ සැලසී තිබේ. පර්යේෂණ හා ව්‍යාප්ති කටයුතු සඳහා ද වියදම් දැරීමේ බාධාවක් නැත.

ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන කුළු බඩු බෝග සඳහා අය වැය මගින් සපයනු ලබන සහනාධාර 24% කින් ද කපා හැරීමට සිදුවේ. මේ අනුව අකාර්යක්ෂම ලෙස නඩත්තු කෙරෙමින් පවතින අපනයන බෝග වගාවන් ඉතා අලාභදායී විය හැකි අතර වගා කටයුතු කාර්යක්ෂම කොට නිෂ්පාදනය ඉහළ නංවා වියදම් පහත් මට්ටමකින් පවත්වා ගැනීමට සිදුවේ.

එක් රටක සිට තවත් රටකට අපනයනය කරනු ලබන කෘෂි නිෂ්පාදන හරහා එරට ශාක හා ශාක වර්ග වලට ආගන්තුක රෝග හා කෘමි පලිබෝධකයින් බෝවීම හා නිස්පාදන වල අඩංගු අහිතකර ද්‍රව්‍ය නිසා ඔවුන්ට හානි සිදුවීම වැළැක්වීම සඳහා එකඟතාවයක් ඇත. බදු පැනවීම ආදිය හැරුණු විට මෙය කෘෂි නිෂ්පාදන අපනයනය සඳහා විශාල බාධාවක් විය හැකිය. වර්තමානයේ අපනයනය කරනු ලබන සියළුම අපනයන කෘෂි බෝග නිෂ්පාදන තුළ රසායනික පොහොර මගින් ශේෂ වන කොටස්, පලිබෝධ නාශක ශේෂ ආදිය අඩංගු වී ඇති බව දැනගන්නට ඇත. මේ අනුව රසායනික රසායන භාවිතය වෙනුවට කාබනික ක්‍රමයට අපනයන කෘෂි බෝග වගා කිරීමට හුරු නොවුව හොත් අපට සැලසී ඇති අපනයන විභවය දුර්වල වීමට ඉඩ තිබේ. ඉතා ඉහළ තාක්ෂණික මට්ටම් වල යන්ත්‍රෝපකරණ හා ගබඩා ක්‍රම අනුගමනය කොට රසායනික ද්‍රව්‍ය ශේෂ ප්‍රමාණයන් අඩු කර ගත හැකි වුවත්, එය ඉතා අධික වියදම් ක්‍රමයක් වේ.

යම් රටක නව බෝග වර්ග බිහි කළ විට ඒවා සුරක්ෂිත කර ගැනීම සඳහාත් ඒවා බිහි කිරීම සඳහා වැය වූ වියදම් පියවා ගැනීම සඳහාත් එම බෝග පේටන්ට් හිමිකම් බලපත්‍ර මගින් ආරක්‍ෂා කර ගැනීමේ සම්මුතියක් ද ඇත. "ස්වර්ණ ලංකා" ගම්මිරිස් හා පහත් බිම් වලට යෝග්‍ය එනසාල්, මෑත දී බිහි කරන ලද නව ප්‍රභේද වේ. පේටන්ට් බලපත්‍ර මගින් ඒ වැනි නව ප්‍රභේද හෝ නව ක්‍රම වාණිජ කටයුතු සඳහා යොදා ගැනීම, අලෙවි කිරීම, ආදී කටයුතු වසර 17 - 20 දක්වා වූ කාලයක් අන් අයට බලපාන ලෙස තහනම් කොට සුරක්ෂිත කර ගත හැකි වේ.

එලෙස බිහි කරන ලද ප්‍රභේද මා පිය පරම්පරා වලට යොදා ගෙන වෙනත් නව ප්‍රභේද එළිදැක්වීම සඳහා ප්‍රභේද හිමියන්ට යම් ගාස්තුවක් ගෙවීමට සිදු වේ. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන වලට එලෙස කටයුතු කිරීම අපහසු වේ. ප්‍රභේද පමණක් නොව ප්‍රභේද වල අඩංගු ජාන ද පේටන්ට් මගින් ආරක්‍ෂා කර ගත හැකි වන අයුරින් කටයුතු කෙරේ. මේ අනුව යම් ප්‍රභේදයක අඩංගු ලක්‍ෂණ වලින් කිහිපයක් අඩංගු ප්‍රභේද පවා බිහි කිරීම තහනම් වේ. ශ්‍රී ලංකාවේ කුමින් හා පැනියුර් නැමැති ගම්මිරිස් වගා කරන්නන්ට ඒවා බිහි කළ ඉන්දියානු අභිජනකයින් වෙත ගාස්තුවක් ගෙවීමට සිදුවිය හැක. වරක් වගා කරන ලද බෝග වල හටගන්නා බීජ වලින් හෝ දඬු කැබලි වලින් පැළ බෝකර ගැනීම සඳහා අවසර ගැනීමට සිදුවිය හැකිය. දේශීය වර්ග දියුණු කර ගැනීම සඳහා විදේශීය ජාන සම්පත් යොදා ගැනීම අපහසු විය හැකිය.

## කුළු බඩු ක්ෂේත්‍රයේ විභවය හා වාසි දායක අවස්ථා

දේශීය කුළු බඩු වලට ආවේනික වූ තත්වය අපට ඇති විශාල සම්පතකි. විශේෂයෙන් ගම්මිරිස්, කුරුඳු හා එනසාල් වල ජානමය හැදියාව මෙයට මනා නිදසුනක් වේ. කුළු බඩු වගා කිරීම ශ්‍රී ලංකාවේ පාරම්පරික කර්මාන්තයකි. මේ නිසා බෝග පිළිබඳ දැනුම, අවශ්‍ය වගා තාක්‍ෂණය ආදිය වගාව පුළුල් කිරීම සඳහා සීමාකාරී සාධක නොවන අතර, දිනකට වඩා සුළු වශයෙන් උනන්දුව වැඩි කිරීමෙන් වුවද නිෂ්පාදනය වැඩි කර ගත හැකි විභවයක් පවතී. නිෂ්පාදන වියදම ඉහළ මට්ටමක පැවැතිය ද, කුළු බඩු සකස් කිරීම සහා කිසිදු විදේශීය යෙදවුමක් අවශ්‍ය නො වන බැවින් රටට ලැබෙන විදේශ විනිමය ප්‍රමාණය අධික ය. තේ, රබර් හා පොල් වගා අතරේ කුළු බඩු වගා කිරීම කෙරෙහි රාජ්‍ය අවධානය හා ආධාර ක්‍රම යොමු වී තිබීම සතුටට කරුණකි. සුළු පරිමාන වගා කරුවන්ට එය ප්‍රයෝජනවත් වේ.

අපනයන බෝග මිල දී ගැනීම සඳහා ග්‍රාමීය මට්ටමේ දී සැලකිය යුතු තරගයක් තිබීම වගා කරුවන්ට වාසිදායක වේ. ඉහළ මට්ටමට යත්ම මෙම ගැනුම් කරුවන් ගේ සංඛ්‍යාව අඩු වේ.

ගැට් සම්මුතිය අනුව බොහෝ රටවල ආනයන නීති රීති ඉවත් වන බැවින් කුළු බඩු සඳහා වෙළෙඳ පොළ විවෘත වේ. ලොව වැඩියෙන් ම කරාබු හා ගම්මිරිස් අපනයනය කරන රට වන ඉන්දුනීසියාව අපනයන සහනාධාර කපා හැරීමට සිදුවන බැවින් අන්තර් ජාතික කුළු බඩු මිල ශ්‍රී ලංකාවට වාසි දායක ලෙස ඉහළ යනු ඇත.

ආනයන බදු අඩු කිරීම හා එක මට්ටමක පවත්වා ගැනීමේ හේතුවෙන් කුඩු කිරීම, ඇසිරීම, මිශ්‍ර කිරීම, තෙල් හා ඔලියෙරේසින් සෑදීම ආදී ක්‍ෂේත්‍ර වල ආයෝජන අවස්ථා වැඩි වේ. මෙම අවස්ථාවෙන් ඵල නෙළා ගැනීම සඳහා නිසි සකස් කිරීමේ පහසුකම් හා නිෂ්පාදන වල යහපත් බවේ චිරස්ථායී භාවය වැදගත් වේ.

## හැඬීමෙන් වෙහෙස මග හැරේ

මනුෂ්‍ය වර්ගයාට හැඬීම පොදු ධර්මතාවයකි. මිනිසුන් හඬන්නේ අධික වේදනාවක් ඇතිවූ විට හෝ වෙනත් ආකාරයකින් හිත දුර්වල වූ අවස්ථාවක දීය. ඉතා වැදගත් සියුම් ඉන්ද්‍රියක් වූ ඇස ආරක්‍ෂා කිරීමට කඳුළු වැදගත් මෙහෙයක් ඉටු කරයි. බැක්ටීරියා වෛරස් වැනි විෂබීජ ඇසට ඇතුළු වූ විට ඒවා විනාශ කිරීමේ නාශකයක් ලෙස ද කඳුළු ක්‍රියා කරයි.

හැඬීමෙන් සිරුරේ වෙහෙස පීඩාව මගහැරී විශාල සහනයක් සැලසෙන බව ප්‍රවීන වෛද්‍ය පිරිසක් පවසා සිටිති. රුධිර පීඩනය, හදවත් රෝග, සිත් තැවුල් මැඩ පැවැත්වීම ආදියට සහනය සලසන ස්වාභාවික මාර්ගය හැඬීම බව "Crying the mystery of Tears" නම් ග්‍රන්ථය ලියූ වෛද්‍ය විලියම් ෆ්‍රේ පවසයි.

දකුණු කැලිෆෝර්නියා විශ්ව විද්‍යාලයේ මනෝ විද්‍යා අංශයේ මහාචාර්ය වරයා වූ වෛද්‍ය ඇල්බට් මාස්ටන් වසර හතක කාලයක් හැඬීම පිළිබඳ පරීක්‍ෂණ පවත්වා තිබේ. හොඳින් හැඬීමෙන් මිනිසෙකුගේ ශාරීරික හා මානසික නිරෝගී භාවය ඇති වන බව සොයා ගෙන තිබේ. හැඬීමේදී අප හෙළන කඳුළු වල ඉතා හොඳ විෂබීජ නාශක ගුණයක් ඇත. මේ බව මුලින්ම සොයාගත්තේ ඇලෙක්සැන්ඩර් සාමිවරයාය. මේ බව පසු කලෙක ඉතාලි වෛද්‍ය විශේෂඥයන් දෙදෙනෙකු විසින් තහවුරු කරන ලදී. බාලපක්ෂඝාත රෝගය වැනි දරුණු රෝග බෝ කරන විෂබීජ නාශනය කළ හැකි ලයිසොයින් නම් ද්‍රව්‍යය අඩංගු බව ඔවුන් පෙන්වා දෙන ලදී. එම නිසා එම විෂබීජ නාශක ලබා ගැනීමට සමහර රටවල කඳුළු බැංකු පවා පිහිටුවා ඇත.

\- පුවත්පත් ඇසුරෙනි-